සාර්ථක කවි පබඳුමක් සඳහා තිබිය යුතු අනුභූතිය කවවේදයිධ සිතමින් වෙහෙසුන මට, නිරායාසයෙන් සිතට ආ අදහස් කිහිපයක් සුපුසිද්ධ ලංකික ලේඛයන්ගේ අදහස් ද සැලකිල්ලට ගෙන ගොනු කරන්නට සිත් දුන්නා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ලිපිය ලිවීමට මට සිත් දුනි.

කවි නිර්මාණයේදී කවියාගේ නිර්මාණයට මූලිකවූ අත්දැකීම් කවවේදයිධ යන කුතූහලය පාඨකයාතුල නිරන්තරයෙන් හටගන්නා හැඟීමයි. මෙලොව ඕනිම් අත්දැකීම් ලබන සෑම මනුෂ්‍යයකුටම ප්‍රකාශ කිරීමට කථාවක් ඇත. එහෙත් සෑම මනුෂ්‍යයකුටම එය කියාගත නොහැක. ප්‍රකාශන මාධ්‍යයට තුරද අය ඒ කථාව ලොවට කියා සිටිති. අනෙක් අය සැහවාම මුතිවන රකිති. එම ප්‍රකාශන මාධ්‍යයන් අතරින් එකක් වන්නේ කාව්‍ය නිර්මාණයයි. කාව්‍ය නිර්මාණය යනු ඉබේම කවියා සිත තුළ පහළ වන්නකැයි මට නොසිතේ. අප ජීවිත කාලය තුළ ලබන දුහසකුත් අත්දැකීම් තුළින් ඒ'වායේ අන්තර්ගත පොද්ගලිකත්වය ඉවත් කොට ඒවා විශ්ව සාධාරණීය අත්දැකීමක් බවට පෙරළාගෙන කරන කාව්‍ය නිර්මාණය සාර්ථක කවියක උපත යැයි මට සිතේ. පොදුවේ සාහිත්‍ය නිර්මාණ ගැන සුගතපාල ද සිල්වා මහතාගේ අදහසකින් මේ පිළිබඳ යමක් උකහා ගැනීම සුදුසු යයි සිතමි.

අත්දැකීම්, චින්දන, මිතිස්සු, සිද්ධීන් ආදී දේ රචකයාගේ මනස හැඟෙනි ගබඩා කාමරයේ රැ ස්වේ. අනතුරුව ඒවා මතු තුළ කිසියම් වෙසක් ගනිමින් කිසියම් හැඩයකට මිශ්‍ර වෙයි. මේ මිශ්‍රණය නිර්මාණයේදී අපමරිටම වේ. කොරීන්ම ශක්තිය නමිති .. (නවයුගය - 1976).

මෙනයින් බලන කල අප ලබන සෑම අත්දැකීමකම නිර්මාණයකට අවශ්‍ය අමු ද්‍රව්‍ය අතර තැකි බව තෝරා බේරා ගැනීමේ හැකියාව කවියා සතු විය යුතුය.

ආර්. ආර්. සමරකෝන් නිර්මාණයන් කිහිවන අපූරු සලකන්නේ කෙස්දැයි විමසා බලමු. නිර්මාණය කියන්නෙ ඇළුතින් යමක් සොයා ගෙන ලෝකයා ඉදිරිපත් කිරීම නොවෙයි. කිසියම් අත්දැකීමක් වසර ගණනක් සිත්සේ සිතින් තමු මර මරා සිට තවත් අසූ ලුටු සිද්ධීන් සමග එකට කලවම් කර චරිතයක් වන සේ එළියට දැමීමක් (නවයුගය - 1977).

මේ ඔනෑම සාහිත්‍ය නිර්මාණයකට පොදු ධර්මතාවය කවියටද පොදු යයි සිතමි. පොදුවේ කළා කාන්තියයක් ගැන සධිමන් නවගත්තේගම ගේ පපත සඳහන් අදහස කවියටද අදාළ බව වැටහේ.

අපූර්ව කළා වස්තුව උපදින්නේ කලාකාරයා ගේ කායික මානසික ජීවිතයද බාහිර විෂය ලෝකය ද අතර හටගත් නිශ්චිත හා අවිනිශ්චිත ක්‍රියා දාමයක ප්‍රතිඵලයක් වශයෙනි (සාහිත්‍යය සමාජවාදය සහ කලා විචාරය).

අපට එදිනෙදා කියවන්නට ලැබෙන කවි පබඳුම් අතරින් බොහොමයක් වාර්තා ස්වරූපයක් ගන්නේ ඇයි දැයි මොහොතකට විමසා බලමු.

අපූර්ව කලා වස්තුව උපදින්නේ කලාකාරයා ගේ කායික මානසික ජීවිතයද බාහිර විෂය ලෝකය ද අතර හටගත් නිශ්චිත හා අවිනිශ්චිත ක්‍රියා දාමයක ප්‍රතිඵලයක් වශයෙනි (සාහිත්‍යය සමාජවාදය සහ කලා විචාරය).

රචකයා අනුභූතියක් ලැබූ දේ දහසක් කැබලිවලට කැඩී චරිත බවට පත්වේ. එහෙත් මේ හැම කැබැල්ලක්ම රචකයාගේ කැබැල්ලකි. එසේ වන්නේ අර අත්දැකීම් කිසියම් ස්වරූපයක් ගැනීමේ දී රචකයාගේ දාෂ්ටිය ඒ හා සංකලනය වන බැවිනි. (නවයුගය - 1977) .

මෙම ප්‍රකාශයෙන් ඊවනිත වෙන්නේ ඔනෑම ගොරහැඩි අත්දැකීමක් උවද අතෙක් අත්දැකීම් සමග සංමිශ්‍රණය වූ පසු කිසියම් භාව ප්‍රකාශණයකට තුලු දෙන සුමටවූ ද, විශුද්ධ සාධාරණීයවූ ද කාව්‍ය නිර්මාණයකට පසුබිම කරගත හැකි බවය. එම අත්දැකීම කවියාගේ සංකල්පනා හරහා ඔප මෙටවම වන හෙයින් එය කවියාගේ නිර්මාණයක් උවද එම මූලික අත්දැකීම කවියාගේම වීම අනිවාර්යය නොවන බවද මින් දැක්වේ.

ප්‍රතිභා ශක්තිය ගැන මාවින් වික්‍රමසිංහ ශ්‍රේෂ්ඨ ගේ අදහස වන්නේ ..නොවදදගත් දේ බැහැර කොට, සරල දේ තෝරා ගැනීමේ විවේක බුද්ධිය අප හඳුන්වන්නේ කවි ශක්තිය හෙවත් ප්‍රතිභා

කවියකින් රස කිහිකිරීම උදෙසා අවශ්‍යය අනිවාර්ය අංගයක් වන්නේ ධවනිකාර්ථගත වදන් ප්‍රයෝජනයට ගැනීමය. වාචාර්ථයට පමණක් සීමාවූ වදන් යෙදීම කවිය වර්තාවක් බවට පත්වීමේ මූලික හේතුව බව මහාචාර්ය නන්දසේන රත්නපාල තම නූතන කාව්‍ය විචාරය යන පොතෙහි පෙරවදනෙන් පෙන්වා දෙයි. බොහෝ ඇකුර කවීන් කාව්‍ය ආකාශීන් තුළ කිරිවම මෙයට හේතුව යයි මට සිතේ, තම මනස තුළ ඇති වවන වල සීමිත කමද මීට තුඩු දිය හැක. කාව්‍යය ඇතුලු ඔනෑම සාහිත්‍ය කාන්තියක්, ලේඛකයා ජීවත්වන සමාජය පිළිබිඹු කරන අතර රස කවිය මගින් රස ගැවේගය දිව්තිය වේ. එහෙයින් කවියේ පරමාර්ථය වන රස ගැවේග පසක ලා, පණිවිඩයක් සමාජයට ගෙන ඒම මූලික අරමුණ කර ගැනීමද කවිය වාර්තාවක් කරන්නට හේතු විය හැක.

දක්ෂ කවියා ගේ ලක්ෂණයක් වන්නේ සමාජයට ගෙනෙන පණිවිඩය සියුම් අපූර්වීන් කවියට අතුළු කර රස නිපදවීම ප්‍රධාන අභිලාෂය කර ගැනීමය. කේයස් ගේ ඔබ මහ මුහුදු මදෙ තනියම වෙසෙන කල සිසියට ගැහෙනු ඇත මෙහි මා නිදන පැල හිමියනි ඔබට මගෙ හදවත මිරිවී කළ සැනසුම සිඟබි මේ පොළ් අතු කුරිය තුළ

ඉහත කවිය රැගත් විසිවුණා තරු කවි පන්තිය විචාරයට ලක් කරන මහාචාර්ය නන්දසේන රත්නපාල පොද්ගලික අත්දැකීම් විශ්වමය අත්දැකීමක් කිරීම කාව්‍යයක එක් ස්වරූපයක් බව පවසා සිටී, එහෙත් මේ කවි පන්තිය කියවන සෑම කෙනෙකු තුළම එහි රසය විඳ ගැනීමේ හැකියාවක් අදද්දැයි මොහොතකට සිතනු මැනවි. මොහෝ විට උගත් බුද්ධිමත් අය අතර ද මෙහි රසය නොඳැනෙන කී දෙනෙකු අත්දැදැයි ඔබම සිතා බලන්න.

එනයින් බලන කල රසය ඉපදීම කවියා ගේ කාර්යය උවද, කවිය විශ්ව සාධාරණීය අත්දැකීමක් වීමට හමි කියවන්නා තුළද යම් ගුණාංගයක් තිබිය යුතුය. කවියා කොතරම් දක්ෂ ලෙස භාව ප්‍රකාශණයක් කිහි කළද එය කියවන්නාට උපරිම රසය ලබා දෙන්නේ කියවන්නා තුළ කවියාගේ නිර්මාණයට තුඩු දුන් අනුභූතිය හැතහොත් අත්දැකීම ඒ අයුරින්ම මැවුන හොත් පමණි. එසේ වන්නට නම් කියවන්නා තුළ තිබිය යුතු ගුණාංගය වන්න් ජීවිතය තුළ ඔනු ඉද අත්දැකීම් තුළින් මුහුකුරා ගිය විඥාණයක් සතුව තිබීමය. පසු අත්දැකීම් සහිත හෝ අත්දැකීම් රහිත උගතකු තුළ උවද මේ ගුණය නොපිහිරීමට ඇති ඉඩකඩ ඉතා විශාලය. ■

විජයසිරි තිලකුමාර
බ්‍රිස්බේන්

කවි කොළය

එල්ලා මැරුව පසු පරලෝකෙට වැඩිය
හමු වී සදාම් හට කොටි ලන්ඩන් බාලා
වීමසා බලා වගතුග පරලොව ආපු
කණගාටුවෙන් කිව්වලු රහසක් මෙහෙම

වැඩ කිඩ බලන කොට අපෙ කොටි ලොක්කාගේ
තමුසෙගෙ පාලනෙන් මොන කෙංගෙඩියක්ද?
වැව්වා නම් කැරට් තෙල් වෙනුවට වැල්ලේ
තවමත් ඔහේමය ජනපති ඉරාකයේ

වෙත්තසිංහ

FOR ALL YOUR ARCHITECTURAL DESIGNS

OSHarc_tec Designs
BUILDING DESIGNERS OF THE NEXT GENERATION
ABN: 87 757 811 673

SRILANKA

NEW HOUSE
EXTENSIONS
RENOVATIONS
INTERIOR
OFFICE BUILDINGS
INDUSTRIAL BUILDINGS

MELBOURNE

OSHAN N.C. PERERA Director
Dip. Civ. Eng. (SL), BArch (UNSW)
1/53-57 SECOND AV, CAMPSITE, NSW-2194
PH: 02 9718 0273.....MOB: 0422 862 898
EMAIL: oshanperera@optusnet.com.au

SYDNEY